
කුරුළු බැද්ද චිත්‍රපටයෙන්

# ආරම්භක ගුවන්විදුලි නාට්‍ය සහ ජේ.ආර්.ගේ සමාජ සේවකයා

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය
ආචාර්ය

**සේන නානායක්කාර**



ශ්‍රී ලාංකේය ගුවන්විදුලි නාට්‍ය ඉතිහාසය 1927 තරම් වූ ඈතට දිවයන්නකි. බ්‍රිතාන්‍ය ගුවන්විදුලි ප්‍රචාරක ස්ථානයෙන් (බී.බී.සී. ආයතනයෙන්) මෙරටට ගෙන්වා ගත් ප්‍රථම කෙටි නාට්‍යය වයර්ලස් ඩ්‍රාමා (Wireless Drama) නමින් ප්‍රචාරය කෙරිණි. ජේ.එස්.එම්. පැටර්සන් මහතාගේ ප්‍රධානත්වයෙන් වූ කොළඹ ආධුනික නාට්‍ය සංගමය විසින් එය නිෂ්පාදනය කරන ලදී. මෙබඳු නාට්‍ය ගෙන්වා දිගින් දිගටම නිෂ්පාදනය කොට ප්‍රචාරය කිරීම නිතිපතා සිදුවිය. ඒ වූ කලී ඉංග්‍රීසි භාෂාව උගත්, ප්‍රභූ පෙළැන්තියට අයත්, පිළිගත් යැයි සමාජ සම්මත පුරවැසියන් ඒ සඳහා සහභාගි වී ඇති බව පෙනේ. එය වෙනමම මාතෘකාවක් යටතේ කතාබහට ලක්විය යුත්තකි.

### පිටපත ජේ.ආර්.ගේ

අපගේ අරමුණ ලාංකේය ගුවන්විදුලි නාට්‍ය පිළිබඳව සටහන් කිරීම බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරමු. අපට මුලින්ම ලාංකේය ගුවන්විදුලි නාට්‍යයක් පිළිබඳව අසන්නට ලැබෙනුයේ 1938 මාර්තු මස 29 වැනිදා ය. පසු කලෙක ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා වූ ජේ.ආර්. ජයවර්ධන මහතා විසින් රචනා කළ එම නාට්‍යය 'සමාජ සේවකයා' නම් වෙයි. එම නාට්‍යය නිෂ්පාදනය කරන ලද්දේ මුදලිඳු ඊ.ඒ. අබේසේකර මහතා විසිනි. එම නාට්‍යය එදින සවස 5.30 සිට 6.00 දක්වා එසැණින් ප්‍රචාරය විය. ජේ.ආර්. ජයවර්ධන - එලීනා ජයවර්ධන පෙම්වතුන් ලෙස එහි රඟපෑ අතර, සෙසු චරිත රංගනයෙන්

ආචාර්ය ජී.පී. මලලසේකර, මුදලිඳු ඊ.ඒ. අබේසේකර, යූ.ජී.පී. ද සිල්වා සහ සී.ඒ. ෆොන්සේකා යන අය එක් වූහ.

බොහෝ ශ්‍රාවක පිරිස් එය ශ්‍රවණය කොට ඇති අතර, එහි හිඟන්නෙකු ලෙස රඟපෑ ශිල්පියා පිළිබඳව පැහැදුණු රත්නපුර ප්‍රදේශයේ එක්තරා කාන්තාවක විසින් ඔහුට තෑගි දෙන ලෙස ඉල්ලා එවකට ගුවන්විදුලි අධිකාරි ෂර්ලි ඩා සිල්වා මහතා නමට රුපියල් 25/= ක තිළිණයක් ද එවා ඇති බව කියැවේ. හිඟන්නා ලෙස රඟපා ඇත්තේ එවකට රජයේ ගුරු විද්‍යාලයේ අධිපතිව සිටි යූ.ජී.පී. ද සිල්වා මහතාය. සිය ප්‍රේමය දෙවැනිකොට සලකා සමාජ සංවර්ධනය උදෙසා සේවයෙහි යෙදෙන ප්‍රේමවන්තයෙකු පිළිබඳව පණිවුඩයක් එයින් ලබා දීමට උත්සාහ කොට ඇති බව පෙනේ. සදාචාරයෙන් උසස්, දියුණු සමාජයක් ගොඩනැඟීම අරමුණු කරගෙන රචනා කරන ලද 'සමාජ සේවකයා' නාට්‍යය ඍජුවම සංවර්ධනය හා බැඳී පැවැති බව ද කියැවේ. නමුත්, ඊට සමකාලීනව තහවුරු වී පැවතියේ කිසියම් කතාවක් හෝ දේශනයක් මඟින් සංවර්ධන පණිවුඩය ඍජුවම ජනතාව අතරට යැවීමේ ක්‍රමවේදයයි. 1947 දෙසැම්බර් මස 07 වැනිදා තැපැල් හා විදුලි සන්දේශ අමාත්‍යවරයා විසින් කැඳවන ලද රැස්වීමක දී තීරණය වූයේ සෞඛ්‍ය කෘෂිකර්මය හා ගොවි කටයුතු මෙන්ම කාලීන තොරතුරු ද ගැමි ජනතාවට ව්‍යාප්ත කිරීමේ නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතු බවයි.

## කුරුලු බැද්ද

1953 ජනවාරි 04 වැනිදා සංවර්ධනාත්මක ගුවන්විදුලි නාට්‍යය විෂයයෙහිලා සුවිශේෂ වූ දිනයකි. පී.කේ.ඩී. සෙනෙවිරත්න විසින් රචනා කරන ලද 'කුරුලු බැද්ද' නාට්‍යය එදින සිට සෑම ඉරිදා දිනකම ප්‍රචාරය විය. පී. වැලිකලගේ නිෂ්පාදනයක් ලෙස ඉදිරිපත් වූ එහි 'බෙම්පි ආතා' නම් ප්‍රධාන චරිතය නිරූපණය කරනු ලැබුවේ වික්ටර් මිගෙල් විසිනි. එස්.ඒ. ජේම්ස් 'සයිමන් අප්පුහාමි' ලෙසත්, රත්නාවලී කුමාරසිරි (කැකුණවෙල) කන්දගෙදර හාමිනේ ලෙසත්, රඟපා ඇති අතර, ධර්ම ශ්‍රී දසනායක විනීතා ශාන්තිලතා මැණිකේ හා චිත්‍රා පාලමකුඹුර ආදීහු සෙසු චරිත රඟපෑහ.

ගැමි ගොවි ජන ජීවන රටාව ගුවන්විදුලි නාට්‍යයක් මඟින් ප්‍රචාරය කිරීමේ මූලික ගෞරවය දිනාගන්නා 'කුරුලු බැද්ද' තුළින් ගැමි ගුවන්විදුලි ශ්‍රාවකයා අපේක්ෂිත ගොවි දැනුම හා විනෝදය සැපයීම ද එවක බලධාරීන්ගේ අරමුණක් වී ඇති බව පෙනේ. 1953 පෙබරවාරි 09 වැනිදා ලංකා ගුවන්විදුලි සඟරාවේ ඒ පිළිබඳව පළ වූයේ මෙසේය:

"සෑම ඉරිදාම සවස 6.00 සිට 6.30 දක්වා ඔබට අසන්නට ලැබෙන්නේ 'කුරුලු බැද්ද' පිළිබඳ රසවත් පුවතයි. හග්ගල්ලේ පී.කේ.ඩී. සෙනෙවිරත්න මහතා විසින් ප්‍රචාරය කරනු ලබන මෙම අභිනව වැඩසටහන ඔබ විසින් නොකඩවා ඇසිය යුත්තකි. ආදර්ශවත් ගැමි පවුලක් පිළිබඳ තොරතුරු රසවත් ලෙස විදහා දක්වන මෙය අමුතුම ආරකට සකස් වී ඇත්තේය."

## ගැමි ජීවන ප්‍රශ්න

ගැමි ජීවන ප්‍රශ්න හා ඔවුන්ගේ ගැටලු කුරුලු බැද්දට විෂය වන බව දක්වමින් 1953 පෙබරවාරි 23 වැනි 'ලංකා ගුවන්විදුලි' සඟරාවේ පිටකවරය සරසා තිබූ ආකාරය සඳහා ඡායාරූපාවලිය බලන්න එහි සඳහන් වී ඇත්තේ "A village conference: Rural problems are discussed weekly in the Sinhalese Sunday Programme Kurulu Bedda" යනුවෙනි.

මෙම නාට්‍යය බොහෝ සෙයින් ජනප්‍රිය වූ බවට සාක්ෂි අපමණය. ඒ සම්බන්ධයෙන් පහත උපුටනය එක් නිදසුනක් යැයි හැඟේ. උපුටා ගැනීම ලංකා ගුවන්විදුලි සඟරාවේ පළවී තිබූ අයුරින්මය.

## බෙම්පි ආතා

'කුරුලු බැද්ද' නම් ග්‍රාමීය සන්ධ්‍යා සේවයෙන් ඉදිරිපත් කරන විශේෂ වැඩසටහනට දැන් වර්ෂයක් පිරී තිබේ. මෙහි නිතර පෙනී සිටින චරිතයක් වන 'බෙම්පි ආතා' ගැන පැහැදුණු අසන්නෙක් මෙසේ ලියා එවයි.

*සැනසිල්ලේ සාදාරණ ලෙස ලැබගෙන සැමගෙ — අදර*
*මේ දේවල් හොඳයි ළමයෝ නිතරම දෙයි සුපිළි — සඳර*
*බාදාකර දුප්පතුන්ට නොසිතුව රැකගැනුම — උදර*
*කවුරුත් ගරු කළ යුත්තෙකි බෙම්පි ආත කන්දෙ — ගෙදර*

*කන්දෙගෙදර හාමිනේල කාගෙත් බල කණුව — ලෙසට*
*මහලු වුවත් මුල්තැන ඇත හොඳ නම ගෙන අහස — උසට*
*ඉස්තානය - අස්තානය දැන පවසන සියුම් — බසට*
*බෙම්පි ආතගේ පිහිටයි 'කුරුලු බැද්දෙ' සැමගෙ — හිසට*

*ගම් සංවද්දනය කෙරෙන සියලු සමිති සංගම් — වල*
*මතු පරලොව තකා කෙරෙන ආගමික වූ පින්කම් — වල*
*මඟුල් තුලා ඈ දහසක් සිරිත් විරිත් යුතුකම් — වල*
*මුල්තැන ඇත බෙම්පි ආත පවසයි ගම් - ගම් — වල*

*ඉහ නිකට ද දත ද කට ද කවුතුක බවකට — ඇදෙද්දී*
*ඇහැ පෙනීම ගැන කුමකට ඉදිකටු මලකඩ — පෙනෙද්දී*
*ඊයෙ පෙරේදා සමහරු හැරමිටි වාරුව — සොයද්දී*
*'කුරුලු බැද්දෙ' බෙම්පි ආත යයි තවමත් ඇතිව — රිද්දී*

*කුනු කුනුවක් ඇති නොවන්න ගම රකගෙන හොඳ හැටියට*
*දෙන ඔවදන් තරුණ පෙළට නිතරම යහපත් අත කට*
*මුනුපුරාල මිනිබිරියන් නන්වන ඉහළම තැන කට*
*තුනුරුවන්ගෙ සව්මුරුන්ගෙ පිහිටයි ආතේ ඔබ හට*

ජී.ඇන්. පෙරේරා - වේයන්ගොඩ

## නවමු අත්දැකීමක්

එවකට සිංහලාංශයේ සංවිධායක ලෙස කටයුතු කළ තේවිස් ගුරුගේ මහතා බී.බී.සී. පුහුණුවකින් පසු ලංකාවට පැමිණ හඳුන්වා දුන් නව ආරක වැඩසටහනක් ලෙස එය ලාංකේය ගුවන්විදුලි ඉතිහාසයට එක්වෙයි.

එවකට ලන්ඩනයේ ජනප්‍රියතම 'The Archers' නම් නාට්‍යය සම්බන්ධයෙන් ඔහු ලබා තිබූ අවබෝධය හා අත්දැකීම් පාදක කොටගෙන මෙම නිෂ්පාදනය ආරම්භ කළ බව ප්‍රකට මතයකි.

පොදුවේ ගත් කල එකල ගුවන්විදුලි නාට්‍ය ලාංකේය ශ්‍රාවකයාට නවමු අත්දැකීමක් වූ බව නිසැකය. එමෙන්ම එහි විචිත්‍රත්වය හා රසය දැනවීම හේතුකොට ගෙන ජනප්‍රියත්වයේ ප්‍රමුඛ තැන් ගෙන තිබිණි. ලංකා ගුවන්විදුලියේ මුල්කාලීන අත්දැකීම් සහිත ඇම්. තායිබ් ජේමන් මහතා 1953 මැයි මස 'ශ්‍රී ලංකා' සඟරාවට ලිපියක් ලියමින් මේ බව සනාථ කරයි.

ගුවන්විදුලි ප්‍රචාරක මෙහෙයේ විශේෂ දියුණුවකට පත්ව ඇති අංශයක් නම් රේඩියෝ නාට්‍යාංශයයි. භාෂා තුනෙන්ම පැවැත්වෙන ගුවන්විදුලි නාට්‍ය, ලංකාවේ එවැනි නාට්‍ය ඇති වෙනත් ආයතන නැති පාඩුව ද තරමක් දුරට පිරිමසිමින් පවතින්නේය. මේ අන්දමින් පැවත එන්නා වූ ජාතික සංවිධානයක් වූ ලංකා ගුවන්විදුලි සේවාව මෙරට සංස්කෘතියේ හැඩගැසීමට අදාළ වෙන මඟක් ගෙන මහජන ප්‍රසාදයට ලක්වෙමින් ස්වකීය තත්ත්වය තහවුරු කර ගැන්මේ යෙදී ඇත්තේය.

## සමාජ ඉදිරි ගමන

මේ අනුව ලාංකේය සිංහල ගුවන්විදුලි නාට්‍යය සෘජුවම රටේ සමාජාර්ථික ඉදිරි ගමනට මෙන්ම සංස්කෘතිකමය දියුණුවට ද හේතු කාරකයක් වන බව එවක විචාරක මතය වී ඇත. සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලිය උදෙසා ගුවන්විදුලි නාට්‍යයේ දායකත්වය ඒ තුළින් අවිවාදයෙන් හෙළිදරව් කෙරෙයි.

ලාංකිකයන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ගොවිතැනය. ඒ සඳහා මේ තුළින් ලැබී තිබෙන ප්‍රමුඛත්වය අද්විතීය වෙයි.

ගොවිකම හා බැඳුණු ඔවුන්ගේ ජීවන රටාව මේ තුළින් යළි ප්‍රතිනිර්මාණය කොට ඔවුන්ට නව සිතුම්-පැතුම්, ආකල්ප, සංකල්ප හා ක්‍රියාකාරිත්වයන් ද හඳුන්වා දෙයි. වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා අවශ්‍ය දැනුම හා අවබෝධය සමගම, වැඩ කිරීමෙහි ලා අදාළ පෙළැඹවීම් කාරකයක් ලෙස ද එය ක්‍රියාකරයි. නිදසුන් ලෙස, 1954 මාර්තු මස 08 වැනිදා ලංකා ගුවන්විදුලි සඟරාවේ පිටකවරයේ පින්තූරය ගනිමු. නාට්‍යයට විෂය වූ කුරුලු බැද්ද ගම්මානයේ සිට වී අස්වනු පටවා ගත් කරත්ත පෙළක් ගමන් කරන අයුරු එහි දිස්වෙයි.

## 'දිය නිල්ලේ රාල' නාට්‍යය

ගැමි ගොවිතැන ඇතුළු ග්‍රාමීය සංවර්ධන කටයුතු අරමුණු කොටගෙන සකස් කළ තවත් නාට්‍ය කිහිපයක්ම කුරුලු බැද්දෙන් පසු ප්‍රචාරය කෙරිණි. 'නෙළුම්ගම ගමන්හාමි' හා 'වෙලේ ගෙදර' යනු එබඳු නාට්‍ය නිර්මාණ ද්වයකි. ජීවිතයේ විවිධ කරුණුකාරණා සාකච්ඡාවට ලක් කරමින් ඔවුන්ගේ ජීවිත තවදුරටත් ඉහළ මට්ටමකට ගැනීමෙහි ලා ඉන් කෙරුණු සන්නිවේදනය වැදගත්ය. ඉන් පසු1960 වසරේ සිට ප්‍රචාරය ඇරඹූ දියනිල්ලේ රාල ඒ අනුව ඉදිරිපත් කළ තවත් ජනප්‍රිය නාට්‍යයකි. පහතින් පළවනුයේ ලංකා ගුවන්විදුලි සඟරාව ඒ පිළිබඳව සිය පාඨකයා දැනුවත් කළ ආකාරයයි.

## ගැමි තොරතුරු

'දියනිල්ලේ රාල' ගැමි සමාජයේ තොරතුරු අලළා නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කෙරෙන විශේෂාංගය අවුරුදු කිහිපයක්ම අපේ අසන්නන්ගේ සිත්ගත් වැඩසටහනකි. 'කුරුලු බැද්ද', 'නෙළුම්ගම ගමන්හාමි' සහ 'වෙලේ ගෙදර' අනුව යමින් ඉදිරි වර්ෂය තුළ ඉදිරිපත් කෙරෙන්නේ 'දියනිල්ලේ රාල'යි.

'දියනිල්ල' ශාන්ත පරිසරයක පිහිටි රමණීය ගම්මානයකි. ගොවිතැනින් දිවි රකගත්, පැරණි සිරිත-විරිත අකුරටම පිළිපදින, ගැමියන්ගේ වාසභූමිය වූ දියනිල්ල තවමත් පවතින්නේ ඒ තරම් දියුණු තත්ත්වයක නොවේ. ගමේම ඉපැදී එහිම ඇතිදැඩි වුණු දියනිල්ලේ ගෙදර කීරාල, ගම්මුලාදෑනි වශයෙන් පත්වීමෙන් පසු මේ ගම්මානයට ලැබෙන්නේ අමුතු ආලෝකයකි.

ගමේ දියුණුවට කටයුතු කිරීම පරමාර්ථය කොට වෙසෙන දියනිල්ලේ රාල ජීවත්වීමේ යහමඟ හොඳහැටි අවබෝධ කරගත් අසල්වැසියන් ගේ යහපත තකා වෙහෙසුණු ගම්මුන්ගේ ආදරය දිනාගත් බොහෝ ඇසූපිරූ තැන් ඇති ගැමියෙකි. දියනිල්ලේ

රාලගේ නායකත්වය යටතේ 'දියනිල්ල' ගම්මානය සෑම අංශයකින් ම ඇතිවන සංවර්ධනය මනා සේ විස්තර කෙරෙමින් ගැමි ජීවිතයේ චමත්කාරය නිරූපණය කෙරෙන මෙම වැඩසටහන ග්‍රාමීය සන්ධ්‍යාව යටතේ සෑම සිකුරාදාවකම සවස 6.00 සිට 6.30 දක්වා ප්‍රචාරය වේ. කෙටිකතා හා විචිත්‍රාංග මගින් අසන්නන් හඳුනාගත් මුදලිනායක සෝමරත්න මහතා විසින් රචනා කරනු ලබන මෙම ගැමි විශේෂාංගය නිෂ්පාදනය කරනු ලබන්නේ චිත්‍රානන්ද අබේසේකර විසිනි.

### ග්‍රාමීය සන්ධ්‍යාව

- කිවුලේකුඹුර නාට්‍යය

තිස්ස රාජකරුණා සහ බර්ටි ගලහිටියාව විසින් ලියන ලද මෙම නාට්‍යය ග්‍රාමීය සන්ධ්‍යාවෙන් ප්‍රචාරය වන්නට පටන් ගත්තේ 1963 අප්‍රේල් 05 වැනිදා ය. සිංහල වෙළෙඳ සේවා වැඩසටහන් සවස 6.00ට නිමා වෙන බැවින් ස්වදේශීය සේවයට අමතරව සිංහල වැඩසටහන් සඳහා ප්‍රචාරයක් ඇරඹීම සුදුසු යැයි එවකට අධ්‍යක්ෂ ජනරාල් එස්.බී. සේනානායක මහතා තීරණය කළෙන්, අප්‍රේල් 04 වැනිදා 'සන්ධ්‍යා සේවය' ඇරඹිණ. එවකට අග්‍රාමාත්‍ය ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසින් විවෘත කරන ලද සන්ධ්‍යා සේවයේ පසුදින වැඩසටහන් අතර 'කිවුලේ ගෙදර' නාට්‍යය ද ප්‍රධාන විය.

එකල විශේෂයෙන් රජරට ජනතාව 'කිවුලේ කුඹුර' වැසියන්ව සිටි බවට ගුවන්විදුලියට තොරතුරු ලැබී ඇත. එනම්, ඔවුන් සිය ජීවන කටයුතු හා පොදු චර්යාවන් පවා එමගින් වෙනස් කර ගන්නට යත්න දරා ඇති බව ඔප්පු වී ඇත. සාර්ථක සන්නිවේදන කාරකයකින් අපේක්ෂිත විශිෂ්ටාර්ථය එයම නොවේද? මෙහි දී සිදුවී ඇත්තේ ගුවන්විදුලි නාට්‍ය තුළින් දියත් කෙරෙන පෙලැඹවීමේ හා ප්‍රජානනයේ න්‍යායයන් (Theories of motivation and perception) මගින් ඔවුන් නියමිත අවධානයට ප්‍රවිෂ්ට කරවීම කෙරෙහි සියුම් ලෙස බලපෑම් කිරීමකි.

- 'මුවන්පැලැස්ස', 'කුඹුරෙගම' හා සංවර්ධන තේමාව:

සංවර්ධනාභිමුඛ සන්නිවේදනයෙහි ලා ගුවන්විදුලි නාට්‍ය පිළිබඳව ඉතිහාසය පිරික්සීමේ දී 1964 මාර්තු මස 12 වැනිදා ප්‍රථම වරට සන්ධ්‍යා සේවයෙන් විකාශනය ආරම්භ කළ මුදලිනායක සෝමරත්න ලියූ 'මුවන්පැලැස්ස' නාට්‍යය ද ප්‍රධාන තැනක් ගනී. නන්දා ජයමාන්න මෙහි මුල් නිෂ්පාදිකාව ලෙස කටයුතු කළ අතර, මුල් කොටස් 319කට පසු 1971 අප්‍රේල් මස 08 වැනිදා එහි ප්‍රචාරය තාවකාලිකව නැවතිණ.

### කොටස් 319ක්

දෙමසකට පසු එනම් 1971 ජූනි 25 දා සිට අද දක්වාම වික්ටර් මිගෙල් විසින් රචනා කරනු ලබන එම නාට්‍යය සතිපතා කොටස් වශයෙන් අඛණ්ඩව ප්‍රචාරය කෙරෙයි. වාර්තාගත ජනප්‍රියත්වයකට හිමිකම් කියූ 'මුවන්පැලැස්ස' නාට්‍යය ලබා ගත් විශිෂ්ට ජනප්‍රසාදය නම් ලාංකේය ගුවන්විදුලි ප්‍රේක්ෂකයාට රහසක් නොවේ.

එවක, පොදු ශ්‍රාවක සමාජයෙන් 'මුවන්පැලැස්ස' ලද ජනප්‍රියත්වය ගැන ඩී.එම්. කොළඹගේ මහතා සිය 'ගුවන්විදුලියයි මමයි' කෘතියෙහි මෙසේ කියයි.

"ජනප්‍රියත්වයෙන් නොඅඩුව කොටස් වශයෙන් ප්‍රචාරය වූ 'මුවන්පැලැස්ස' සන්ධ්‍යා සේවයෙන් අරඹන ලද්දකි. පසුකලෙක වර්ෂයක් පමණ කල් මම ශ්‍රවණ පර්යේෂණ කටයුතුවල නියැළී සිටියෙමි. දිවයිනේ නොයෙක් පළාත්වල අසන්නන්ගෙන් දැනගන්නට ලැබුණු අන්දමට සියයට අනූවක් (90%) පමණ දෙනා වැඩියෙන්ම ඇසීමට කැමැති වැඩසටහන 'මුවන්පැලැස්ස' බැව් එහි දී අනාවරණය විය."

**ඩී.එම්. කොළඹගේ - 'ගුවන්විදුලියයි මමයි' (104-105 පිටු)**

මෙහි වැදගත්කම වන්නේ අනෙකක් නොව, විවිධ සංවර්ධන පණිවුඩ, ශ්‍රාවක සමාජය හරහා ව්‍යාප්ත කිරීම ඉතා සාර්ථකව එමගින් සිදු කිරීමයි. නමුත් ශ්‍රාවක ජනතාව ඒ බව ඍජු ලෙසම දැන සිටියේ නැත. හුදෙක් රසවත් නාට්‍යයකින් පිරිනැමෙන සරල විනෝදාස්වාදය පමණක් මතුපිටින් හෙළිදරව් වුව ද, එහි අන්තර්ගතය සංවර්ධන පණිවුඩ රාශියකින් සමන්විත විය.

### සෞඛ්‍ය තොරතුරු

කොලරාව හා මැලේරියාව මර්දනය සම්බන්ධයෙන් ඉන් ලබා දුන් සෞඛ්‍ය විද්‍යාත්මක තොරතුරු පොදු ශ්‍රාවකයා අතරට ගියේ නාට්‍යානුසාරයෙනි. ගැමි ජීවන රටාව හා බැඳුණු මිනිස්කම් හා නොමිනිස්කම් ද, හපන්කම්, මෝඩකම් හා පුරසාරම් ද මේ තුළින් මොනවට ප්‍රතිනිර්මාණය කෙරිණ. විජේරත්න වරකාගොඩ (ආරච්චිල/ කෝරලේ මහත්තයා) රත්නාවලී කැකුණවෙල (එතනහාමි/ මැණිකේ) වික්ටර් මිගෙල් (වෙඩික්කාරයා/ කදිරා) නෙතලි නානායක්කාර (බිනරමලී/ කොමලී) වොලී

නානායක්කාර (සිඤ්ඤෝ/ උක්කුබණ්ඩා) ගැමුණු විජේ සූරිය (වෙදමාමා/ පිනා/ ඩිංගි/ ගුරුන්නාන්සේ) ධර්ම ශ්‍රී මුණසිංහ (ඉස්කෝලෙ මහත්මයා) හා මුදලිනායක සෝමරත්න (සුදුඅප්පු) යන පිරිස එහි ප්‍රධාන වූ අය වෙති.

ඒ අතර, 70 දශකයට ආසන්නව තිබිය දී රටේ ප්‍රචලිතව පැවැති සංවර්ධන ආයතන හා ඒවායේ ක්‍රියාකාරකම් පසුබිම් කොට ගෙන ද ගුවන්විදුලි නාට්‍ය ඉදිරිපත් කෙරිණ. ග්‍රාම සංවර්ධන සමිති, තරුණ සංවිධාන හා විවිධ ගොවි සංවිධාන ද ඒ ඒ නාට්‍යයන්ට විෂය විය. ජිනසේන යකුපිටිය නිෂ්පාදනය කළ අමරදාස ගුණවර්ධනගේ 'කුඹුරේගම' නාට්‍යය ඊට නිදසුන්ය. එවකට දැඩි ලෙස මතවාදයට තුඩු දී තිබූ 'ගොවිකාරක සභා' ක්‍රියාකලාපය හා සමස්ත සංවර්ධන ක්‍රියාදාමයෙහි ලා ඒ තුළින් ලබා දිය හැකි දායකත්වය හා සම්බන්ධ තොරතුරු ඉන් ප්‍රකට කෙරිණ. 1969 අප්‍රේල් මස 03 වැනිදා කොටස් වශයෙන් ප්‍රචාරය අරඹා ඇති එම නාට්‍යය ද, ලාංකේය සංවර්ධනාත්මක ගුවන්විදුලි නාට්‍ය විෂයයෙහි ලා ප්‍රධාන කොට ගැනේ. ඒ සමඟම ප්‍රචාරය වූ පී.කේ.ඩී. සෙනෙවිරත්නගේ 'හේන්යාය' හා 1980 දී ප්‍රචාරය කරන ලද වික්ටර් මිගෙල් ගේ 'රත්මල්යාය' ද ඒ අතර වෙයි. නන්දා ජයමාන්න හා පී. වැලිකල විසින් මෙම නාට්‍ය පිළිවෙළින් නිෂ්පාදනය කර ඇත.

- 'පහන්සිළුව' නාට්‍යය හා සංවර්ධන අරමුණු

එපමණක් නොවේ. කෘෂිකාර්මික සංවර්ධනයට අමතරව, රෝග වැළැක්වීම, සෞඛ්‍ය හා පෝෂණය, ශාරීරික ස්වස්ථතාව හා පවුල් සංවිධානයෙහි අවශ්‍යතාව වැනි තේමාවන් ද මේ මගින් පුළුල් ලෙස සාකච්ඡාවට ලක් කෙරිණ. ගුවන්විදුලි සංස්ථාවත් සෞඛ්‍ය අමාත්‍යාංශයත්, ඒකාබද්ධව යුනිසෙෆ් (UNICEF) ආයතනයේ අනුග්‍රහයන් 1974 - 1975 අතර කාලය තුළ දී ගුවන්ගත කළ 'පහන්සිළුව' නාට්‍යය ද මීට කදිම නිදසුනකි.

## පවුල් සංවිධානය

'ප්‍රජා සෞඛ්‍ය හා පවුල් සංවිධාන තේමාව මත ගොඩනැඟුණු 'පහන්සිළුව' 1974 ජූලි මස 26 වැනි දින ඇරඹී, 1975 ජූලි මස 25 වැනිදා අවසන් විය. සෑම සිකුරාදාම රාත්‍රී 9.15 සිට 9.30 දක්වා එය ප්‍රචාරය කෙරිණි. සැලසුම් කළ කුඩා පවුලක අගය ගෙනහැර පෑම අරමුණු කොටගත් 'පහන් සිළුව' ආයුර්වේද වෛද්‍යවරයෙකු වූ පණ්ඩිතරත්න හා ඔහුගේ 14 දෙනෙකු ගෙන් සමන්විත පවුල වටා ගෙතී තිබිණ. එක් එක් සතියේ වැඩසටහනකින් විශාල පවුල මුහුණ දෙන ගැටලු නාට්‍යානුසාරීව ඉදිරිපත් විය.

මැලේරියාව පණුරෝගය, පාචනය, උදරාබාධය වැනි රෝග තත්ත්වයන් ද, පෝෂණය, මවුකිරි දීම, පාරිසරික සෞඛ්‍යය, ප්‍රතිශක්තිකරණය හා පවුල් සංවිධානය වැනි විෂය කාරණා ද ආදී වශයෙන් සෞඛ්‍ය තේමාවන් ගණනාවක් එයින් සාකච්ඡාවට ගැනිණ. මෙය වඩාත් ජනප්‍රිය වූ බවට දැක්වෙන ප්‍රධානතම සාධකය වූයේ නාට්‍යාවසානයේ ඒ ඇසුරෙන් සතිපතා අසන ප්‍රශ්නයට ලැබෙන පිළිතුරු සපයන අසන්නන් තෝරා තෑගි ප්‍රදානයක් ද සෞඛ්‍ය අමාත්‍යාංශයේ හා යුනිසෙෆ් ආයතනයේ අනුග්‍රහයෙන් සිදු කෙරිණ. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මේ සඳහා ආයතනික මට්ටමින් දැක්වූ සම්බන්ධීකරණය අතිශය ප්‍රශංසා කටයුතු විය.

## පවුල් සෞඛ්‍යය

විශේෂයෙන් පවුල් සෞඛ්‍ය කටයුතුවලට ජනතාව හවුල් කර ගැනීමේ අපේක්ෂාව ඇතිව විසිරණය කරන ලද මෙම නාට්‍යයන්හි සන්නිවේදන ක්‍රියාදාමය බොහෝ සෙයින් සාර්ථක වූ බව පැහැදිලිය. සෞඛ්‍ය මූලික තොරතුරු තම ජීවිතයට සම්බන්ධ කර ගනිමින් ඒ අනුව කටයුතු කිරීමේ වැදගත්කමත්, සකස් වූ පවුලක ඇති වටිනාකමත් ආයාසයකින් තොරව පහසුවෙන් අවබෝධ කර ගැනීමට එමගින් හැකිවූ බව එම නාට්‍ය කෙරෙහි ශ්‍රාවකයා දැක්වූ ප්‍රතිචාරවලින් විද්‍යමානය.

ගැමියා පාරම්පරික ජන ආකල්පවලින් ඈත් කිරීම බෙහෙවින් අපහසු කාර්යයකි. සංවර්ධන සන්නිවේදන කාර්යාවලියේ දී සමාජ විද්‍යාඥයාත්, සන්නිවේදකයාත්, මුහුණ දිය යුතු ප්‍රධාන ගැටලුවකි මෙය. නවීන ආකල්ප හා හැකියාවන් පාරම්පරික අදහස් දරන්නන් තුළට දැමීමට අපහසු වන්නේ ඒ සඳහා අධික වියදම නිසා නොව, එයට පෙර වසර සිය ගණනක් ඔවුන් තුළ පැවතෙමින් තිබූ ආකල්ප, විශ්වාස හා ප්‍රතිපත්ති වෙනස් කිරීමට ඇති අපහසුව නිසයි. ගුවන්විදුලි නාට්‍ය සාර්ථක වූ බොහෝ රටවල කරන ලද පර්යේෂණ හා අධ්‍යයනයන් තුළින් පැහැදිලි වී ඇත්තේ නාට්‍ය ශ්‍රවණය කරන්නන් එහි චරිත තුළින් ජීවිතයේ යථාර්ථය දකින අතර, එය ස්වකීය ජීවිතවලට ද ආරෝපණය කර ගැනීමට සියුම් ලෙස පෙලඹෙන බවයි.

'අමතක වූ සාධකය' නාට්‍යය හා සමාජ සංවර්ධනය

## චර්යාත්මක බලපෑම

කෘෂිකාර්මික හෝ වෙනත් සංවර්ධන ක්ෂේත්‍රයන් ඔස්සේ ඍජු ලෙස පණිවුඩ සන්නිවේදනය කිරීමට අමතරව නිර්මාණශීලී නාට්‍ය ප්‍රබන්ධයන් මඟින් පුළුල් සමාජ විද්‍යාත්මක වූ ඥානන ක්‍රියාවලියක් ද දියත්කළ හැකි බව සත්‍යයකි. සමාජ චර්යාවන් විග්‍රහයට ලක් කරමින් ලබා දෙන ජීවිතාවබෝධය ද සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලියේ දී වඩාත් වැදගත් වෙයි. මිනිසා කන බොන අඳින පලඳින යන එන ක්‍රියා කරන ආදී වශයෙන් වූ සකලවිධ ක්‍රියාකාරකම් උදෙසා මෙන්ම, සිතන පතන, අරමුණු කරන අදහස් කෙරෙහි ද සියුම් බලපෑම් කොට චර්යාත්මක වෙනස්කම් ඇති කිරීමට එකී සන්නිවේදනය උපයෝගී කොට ගැනේ.

1954 ජූනි මස 06 වැනිදා ඉරිදා රාත්‍රී 8.00ට කොටස් වශයෙන් ප්‍රචාරය වීම ආරම්භ කෙරුණු 'අමතක වූ සාධකය' එබඳු සන්නිවේදනාත්මක ශක්‍යතා ප්‍රකට කරන නිර්මාණශීලී ගුවන්විදුලි නාට්‍යයක් බවට ඉතිහාසය දෙස් දෙයි. ඉංග්‍රීසි ජාතික ඇලන් කෝන් හිල්ගේ මුල් කෘතිය ඇසුරින් 'අමතක වූ සාධකය' ගුවන්විදුලියට සකස් කළේ පී. වික්ටර් මිගෙල් වන අතර, එය නිෂ්පාදනය කරනු ලැබුවේ දේවාර් සූරියසේන විසිනි.

1954 මැයි මස 31 වැනිදා 'ලංකා ගුවන්විදුලි' සඟරාවේ මෙම නාට්‍යය පිළිබඳව පළකර තිබූ හඳුන්වාදීමක් ඒ අයුරින්ම පිටපත් කොට යළි ඉදිරිපත් කරනුයේ කරුණු එලෙසින්ම ලබා දෙනු රිසියෙනි.

## විරුද්ධවාදිකම්

එංගලන්තයේ රට අඟුරු ආකරවල කම්කරුවන්ගේ පටන් සිඩ්නි නුවර කර්මාන්ත අධ්‍යක්ෂවරයින් දක්වා මේ නාට්‍යය නැරඹූ සෑම දෙනෙකුගේම සිත්හි මෙය නැරඹීමෙන් අමුතු ආලෝකයක් ඇති විය. එකිනෙකා සමඟ විරුද්ධව හිටි කම්කරුවෝ හා ව්‍යාපාරිකයෝ මෙය නැරඹීමෙන් පසු සිය විරුද්ධවාදිකම් අමතක කොට දැමූහ. නොසන්සුන් බවක් පළකළ පවුල් දහස් ගණනක් නාට්‍ය නැරඹීමෙන් පසු සන්සුන් වූහ. මේ නාට්‍යය ගොඩනැඟී ඇත්තේ විශාල වෙළෙඳ ව්‍යාපාරික අධ්‍යක්ෂවරයකුගේත්, කම්කරු නායකයෙකුගේත් ගෘහයත් හා ජීවිතයත් මතය. වෙළෙඳ අධ්‍යක්ෂවරයා කම්කරු නායකයා එකිනෙකා සමඟ විරුද්ධවාදිකම් පවත්වති. විශාල වැඩ නැවැත්වීමකට කටයුතු පිළියෙළ වන බව පෙනේ. මේ පවුල් දෙක්හිම පුතෙක්, දුවක් හා බිරියක් ද සිටිති. සමාජ තත්ත්වය අතින් එකිනෙකින් වෙනස් වුව ද පවුල් දෙක්හිම ඇත්තේ එක හා සමාන ප්‍රශ්නය. අමතක වූ සාධකය මතක් වන්නේ මෙහිදී ය. එයින් ඔවුන් එකිනෙකා අතර සමඟිය ඇතිවෙයි. පවුල්වල සමඟිය ඇතිවෙයි. පවුල්වල සමඟිය තහවුරු වෙයි.

වෙළෙඳ ව්‍යාපාරිකයාත්, කම්කරු නායකයාත් මිතුරුකම් ඇතිකර ගනිති. මේ සියල්ලටම හේතුව කුමක්ද? හේතුව 'අමතක වූ සාධකය' සිහිවීමයි. ඉතින් මේ කරුණ? ඔබ එය දැන ගැනීමට කැමැත්තෙහිද? එසේ නම් 'අමතක වූ සාධකය' නාට්‍යයට සවන් දෙන්න. ප්‍රචාරය වන්නේ ගුවන්විදුලියේ සිංහලාංශයෙනි. පළමුවෙනි කොටස ජූනි 06 වෙනි ඉරිදා රාත්‍රී 8.00ට.

## පුරුෂාර්ථ වර්ධනය

උක්ත හඳුන්වා දීමට අනුව නාට්‍යය තුළින් ගොඩනැගුණු චිත්ත විපර්යාසය මුළුමහත් සමාජයේම ගමන් මාර්ග සියුම් ලෙස වෙනස් කිරීමෙහි ලා බලපෑ බව පෙනේ. බුදු දහම තුළ කුළු ගැන්වෙන අතිශය උත්තරීතර ගැඹුරු ධර්ම කාරණයක් වුව වඩාත් සරල සන්නිවේදනයක් ලෙස ප්‍රතිනිර්මාණය කිරීමේ හැකියාව මෙයින් පෙන්නුම් කොට ඇත.

මිනිස් සමාජය තුළ වර්ධනය විය යුතු අත්‍යවශ්‍ය පුරුෂාර්ථයන්ගෙන් බැහැරව එකී සමාජ සාරධර්මයන් දියුණු සමාජයක විද්‍යමාන විය යුතු සාධනීය ලක්ෂණයක් බවත් ඒ මඟින් දැඩි ලෙස අවධාරණය කෙරේ.

ශ්‍රී සුචරිත වර්ධන ව්‍යාපාරය විසින් ඉදිරිපත් කරන ලද මෙම නාට්‍යය ද මහත් සේ ජනප්‍රිය විය. මේ එබඳු එක් නාට්‍යයක් පමණි. මෙබඳු නාට්‍ය නිර්මාණ දහස් ගණනක් ලංකා ගුවන්විදුලි ඉතිහාසයට එක්වී ඇතැයි සිතේ. ප්‍රස්තුත සමාජ සංවර්ධනයෙහි ලා එකී නිර්මාණයන් තුළින් ලාංකිකයා කිසියම් වූ ඉෂ්ට දායකත්වයක් ලබා ඇතැයි සිතීම අතිශයෝක්තියක් නොවනු ඇත.

ඉහත කරුණු හා සාධක පරීක්ෂා කිරීමේ දී ගුවන්විදුලි නාට්‍යය එදා පටන් සමාජයට ඉටුකර ඇති මෙහෙවර ප්‍රශංසනීය බව හොඳින්ම තහවුරු වේ.

උපුටා ගැනීම:
ජාතික සංවර්ධන සහ ලාංකේය ගුවන්විදුලිය
**ආචාර්ය සේන නානායක්කාර**
සකස් කළේ
**ඩී. රංජිත් පීරිස්**

■